පන්තිය: 12

විෂය: රසායන විද්‍යාව

සතිය: සැප්තැම්බර් 16-22

1.ඒකකය : රසායනික ගණනය

2.ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:

- අ.පො.ස. උ.පෙළ රසායන විද්‍යා සම්පත් පොත පිටු අංක 90-102හොඳින් අධ්‍යයනය කරන්න.
- මෙම පාඩමට අදාළව ඊ නැණ පියස , ඊ තාක්ෂලාව වෙබ් සයිට් වලට පිවිස වැඩිදුර හැදැරීම් කරන්න.
- ඒවායේ ඇතුලත් ආදර්ශ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

3.ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගත හැකි ඉගෙනුම් ආධාරක

ඊ නැණ පියස

https://www.enenapiyasa.lk/lms/course/view.php?id=548

ඊ තක්ෂලාව

https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=789#section-3

https://www.e-thaksalawa.moe.gov.lk/moodle/mod/hvp/view.php?id=33746

https://www.e-thaksalawa.moe.gov.lk/moodle/mod/hvp/view.php?id=33924

https://www.e-thaksalawa.moe.gov.lk/moodle/mod/hvp/view.php?id=33925

අමතර පොත්: රසායන විද්‍යා සම්පත් පොත (රසායනික ගණනය)

4.ඉගෙනුම් ඵල

- දෙන ලද ප්‍රභේදයක ඇතුළත් පරමාණුවල ඔක්සිකරණ අංකය සොයයි.
- IUPAC නීති භාවිත කර රසායනික සූත්‍ර හා නාම ලියයි.
- නිරන්තරයෙන් භාවිත වන රසායනික සංයෝගවල සාමාන්‍ය නාම සඳහන් කරයි.
- ඇවගාඩ්රෝ නියතයේ (L) අගය ඒකක සහිත ව සඳහන් කරයි.
- මවුල සහ ඇවගාඩ්රෝ නියතයට සම්බන්ධ ගනනය කිරීම් සිදු කරයි.
- ප්‍රතිශත සංයුතිය දන්නා විට ආනුභවික සූත්‍රය නිර්ණය කරයි.
- ආනුභවික සූත්‍රය හා අණුක ස්කන්ධය දන්නා විට අණුක සූත්‍රය ද නිර්ණය කරයි.
- අණුක සූත්‍රය දී ඇති විට එහි අඩංගු මූල ද්‍රව්‍යවල සංයුති ගණනය කරයි.
- සංයුතියෙහි පරාමිති (ස්කන්ධ භාගය, පරිමා භාගය, මවුල භාගය, සාන්ද්‍රණය) සමාලෝචනය කරයි.
- ස්කන්ධ භාගය, පරිමා භාගය හා මවුල භාගය සම්බන්ධ ගැටලු විසඳයි.
- ඒකක පරිමාවක ඇතුළත් ද්‍රාව්‍ය මවුල ප්‍රමාණය සාන්ද්‍රණය ලෙස අර්ථ දක්වයි. (mol/volume) ඉතා කුඩා ප්‍රමාණ වලින් අඩංගු ද්‍රව්‍යයන්ගේ සංයුති ප්‍රකාශ කිරීමට ppm හා ppb භාවිත කරයි.
- සංයුතිය ස්කන්ධය/ පරිමාව, ප්‍රමාණය/ පරිමාව ලෙස ප්‍රකාශ කරයි.
- ස්කන්ධය / පරිමාව සහ ප්‍රමාණය / පරිමාව (සාන්ද්‍රණය) සම්බන්ධ ගැටලු විසඳයි.
- විද්‍යාගාරයේ ඇති පිපෙට්ටු, බියුරෙට්ටු, බීකර, මිනුම්සරා වැනි වීදුරු උපකරණ සහ සිව්දඬු තුලාව නිවැරදි ව පරිහරණය කරයි.